# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/15 - 2016 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා - 2016.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/13/05/2013

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.09.01 දිනැති හා අංක 1878/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.08.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හම්බන්තොට, ලංකා සෝල්ට් ලිමිටඩ්, ලුණු නිලධාරී (iv ශ්‍රේණිය) හි ටී. එම්. ප්‍රියන්ත මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් හම්බන්තොට, මහලේවාය හි පිහිටි ලංකා සෝල්ට් ලිමටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.09.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

යොමු අංකය : IR/13/05/2013

ටී. එම්. ප්‍රියන්ත මයා,
ලුණු නිලධාරී iv ශ්‍රේණිය
ලංකා සෝල්ට් ලිමිටඩ්,
හම්බන්තොට.

නඩු අංකය : ඒ - 3581 ඉල්ලුම්කරු

ලංකා සෝල්ට් ලිමිටඩ්,
මහලේවාය,
හම්බන්තොට.

වගඋත්තරකරු

දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වූයේ

ලංකා සෝල්ට් ලිමිටඩ් හි සේවයේ නියුතු ටී. එම්. ප්‍රියන්ත මහතාට එරෙහිව කරන ලද විනය පරීක්ෂණයේදී ලබා දී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳ වේ.

#### ප්‍රදානය

මෙම නඩුව විභාග කිරීම සඳහා 2014.08.19 වන දින මා වෙත යොමු කිරීමෙන් අනතුරුව 2014.11.25 වන දින පළමු වතාවට කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ මෙම නඩු විභාගය අවසානයක් කළ හැකි බවත් මේ වන විට දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය හා ලිඛිත සැලකිරීම් මත නියෝගයක් ලබා ගැනීමට දෙපාර්ශ්වයේ එකඟත්වය ප්‍රකාශ කරන බවයි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඒක පුද්ගල විනිශ්චය සභාවේ විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පහත දඬුවම් වලට යටත්ව ඉල්ලුම්කරු සේවයේ පිහිටුවන ලදී. එකී දඬුවම් නම්

1. වැඩ තහනම් කර තිබූ කාල සීමාවට හිඟ වැටුප් හෝ වෙනත් කිසිදු දීමනාවක් ලබා නොදීම




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ඉදිරි වසර තුනකට වැටුප් වර්ධක විලම්භනය කිරීම

3. නිෂ්පාදන අධිකාරි III ශ්‍රේණියේ සිට ලුණු නිලධාරි IV ශ්‍රේණියේ තනතුරට වැටුප් පරිමාණයේ වෙනසක් නොමැතිව පහත දැමීම.

4. ඉදිරියේ දී මෙවැනි විෂමාචාර ක්‍රියා සිදු කරනු ලැබූ බව සනාථ වුවහොත් සේවය අවසන් කිරීමට ආයතනය කටයුතු කිරීම

ඉදිරියේ දී අදාළ රාජකාරි වගකීම් නිසි පරිදි ඉටු කරන ලෙස තරයේ අවවාද කර ඇත.

පසුව ඉල්ලුම්කරුගේ අභියාචනය සලකා බලා සානුකම්පිතව 2 වන සහ 3 වනුව සඳහන් කරන ලද දඬුවම් ඉවත් කර ඇත.

ඉහත කාල සීමාව තුළදී ඉල්ලුම්කරුගේ ක්‍රියා කලාපය පිළිබඳව කිසිදු ඉහළ නිලධාරියෙකුගේ අණට අවනත නොවීම හෝ විෂමචාර ක්‍රියාවක් පිළිබඳව වාර්තා වී නොමැති හෙයින් ඉල්ලුම්කරුගේ ආයාචනයෙන් හා ඔහුගේ කල් ක්‍රියාවන් පිළිබඳව සලකා බලා ඉල්ලුම්කරුට විරුද්ධව නගා තිබූ දඬුවම් අතරින් 2, 3, 4 වනුව සඳහන් කරන ලද දඬුවම් ඉවත් කිරීම සාධාරණ හා යුක්ති සහගත බව මම තීරණය කරමි.

''ඉදිරියේදී මෙවැනි විෂමචාර ක්‍රියා සිදු කරනු ලැබ සනාථ වුවහොත් සේවය අවසන් කිරීමට ආයතනය කටයුතු කිරීම යන්න'' ද ඉවත් කරන අතර, ඉදිරියේදී අදාළ රාජකාරි වගකීම් නිසි පරිදි ඉටු කරන ලෙස ඉල්ලුම්කරුට තරයේ අවවාද කරනු ලැබේ.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී මාස තුනක් ඇතුළත මෙම නියෝගය ක්‍රියාත්මක විය යුතු බවද ප්‍රකාශ කරමි.

එය සාධාරණ හා යුක්ති සහගත යැයි මාගේ හැඟීම හෙයින් ඒ අනුව මාගේ ප්‍රදානය මෙසේ නිකුත් කරමි.

නීතිඥ කේ. ඒ. ටෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු,
කාර්මික අධිකරණය.

2016 සැප්තැම්බර් මස 01 දින දී ය.

10 - 533

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.